








මව් බිමෙන් බැහැරව ජීවත් වුවත් තම රට හා තිබෙන බැඳීම කිසිවටකත් අමතක කල නොහැකි නිසා නිතරම විමසිල්ලෙන් සිටිනා විට රට කෙමෙන් පිරිහීම කරා යොමු වී යන තත්වයක් පෙනෙන නිසා මගේ මනස නිතරම මගේ ළමා කාලය වෙත යොමු වෙන්නේ අනාගතය බාර ගැනීමට සිටිනා ඉදිරි පරපුර වෙනස් වන සමාජයේ ගොදුරක් බවට පත්වීගන යන ස්වරූපයක් පැහැදිලි-වම දක්නට ලැබෙන නිසයි.

මේ තත්වය ඇතිවීමට මූලික හේතුව-ක් විදිහට මම දකින්නේ ලමා ලෝකය වැඩිහිටියන් විසින්ම දරුවනට අහිමි කර තරගකාරී ලොව සමග ගැටීමයි.

අවිවේකී ජීවිතයක් ගතකරමින් කාලය හා සටනක නිරත වුවත් නිතරම මනසින් අතීත මතකයන් වෙත යොමු වෙනවිට ළමාකාලය මම ගතකල හැටි කරා මා සිත යොමු වන්-න් මටත් නොදැනීමයි. එකල මගේ හොදම මිතරාත් වීරයාත් වුනේ මගේ සීයයි.

බාලාංශ පන්ති වල ඉගෙනගත් තොප්පි වෙලෙන්දා කදාවලලු වැනි කතන්දර මුලින්ම කියා දුන්නු ගුරුතමා වූයේ මගේ සීයයි. එනිසාම මගේ පියතම විෂය සිංහල භාෂාව භාෂාව බවට පත් වූවා පමණක් නොවේ පොඩි කාලයේ සිටම කියවීමට ඇල්මක් ඇති කරමින් දිවියටආලෝකයක් ලබා දුන්නේ මගේ සීයයි. එකල හවස් වරුවම ලමා අපි එකතවෙලා සෙල්ලම් කරලා රණ්ඩුවක් හදාගන මමඅඩාගන ඇවිත් නඩු කියන්නෙත් සීයාටයි. එදා නොතේරුනත් සීයා එදවස දුන්ඔවදන් තුලින් එකමුතකමේ හා ඉවසීමේ අගය පෙන්වමින් අනාගතයට වටිනා මග පෙන්වීමක් කල බව තේරෙන්නේ අදටත් එහි අර්ථය මනාව වැටහෙන නිසයි. මගේ ආච්චි අම්මා කියල දෙන සුරංග නා කතා වලට වඩා එකල මම ප්‍රිය කලේ සීයා කියාදෙන කතන්දර වලටයි. කොටියා වලහා දිවියා වැනි නපුරු සත්ත වගේම හාවා මුගටියා මෙන්ම ගිරවි මයිනෝ වැනි අහිංසක සතුන් ගැනත් බොහෝම රසවත් හා ලස්සණ වගේම බිය ගෙන දෙන කතාත් ඒ අතර තිබුනා මට මතකයි.

අද අප සමාජයේ මිනිසුන් හා ගැටෙන විට එතුලිනුත් ඉගෙන ගතයුත දෑ බොහෝම-යක් තිබෙන බව කාලය විසින්ම පෙන්වා දී තිබෙනවා.

මගේ සීයා තරුණ කාලයේ යාපනයේ රැකියාවක් කල බව හා එම කාලයේ දඩයමේ ගිහින් ලද අත්දැකීම් තුලින් ලද පන්නරය නිසා පරිසරය ගහකොල සත්තු ගැන ලොක දැනුමක් ලද බව පසුකලක මට දැන ගැනීමට ලැබුන විට මට සිතුනේ එම දැනුම තුලින් සීයා මගේ දිවි මග එලිය කිරීමට ගත් උත්සාහය මා ලද විශාල දායාදයක් බවයි. මගේ සීයාට වත්ත පහල එලවලු කොටු කීපයක් බුලත් කොටුවක් හා කෙසෙල් වගාවක් තිබුනා. සීයාගේ කාලයෙ-න් වැඩි කොටසක් ගතකලේ එහි වැඩවලට.

ඒ වැඩ සදහා පුංචි ලිදක් වත්ත පහල කපාගනත් තිබුනා. මගේ අක්කාගෙන් ඒ වැඩවලට ලොකු සහයෝගයක් ලද මුත් මම වතුර ඇදලා ලිද ලග මඩ කරන නිසා මාව ඒ වැඩ වලට සම්බන්ද කරගන්තේ නැහැ. මමත් මුරණ්ඩුකමට ගිහින් වදයක් වෙලා බැණුම් අහල ගටිකාපු අවස්තාත් තිබුනා. පුරුද්දක් ලෙසදිනපතා පුවත්පත් කියවීම නොකඩවාම සීයා කරගන ගියා.

කාලක් ගතවෙලා ගිහින් අපේ පවුලට නංගියි මායි එකතවෙලා අක්කයි මමයි යොවුන්විය කරා පා තබමින් සිටිනවා.

දැන් පෙරමෙන් කල්ලියට වැටිලා සෙල්ලම් කිරීමටත් ගෙදරින් අවසර නැහැ. සීයාත් හැරමිටියෙන් යන කාලයට ඇවිත්. සීයාට දැන් හරියකට කතා කරගන්නත් බැහැ. කන් ඇහෙන්නෙත් නැහැ.

පත්තරය කියවන්නත් අමාරුයි. එකල මම අමතර පන්තියකට යනවා. එම වැඩ ඉවර වී ගෙදරආ විගසම සීයාගේ කාමරයට යන මම ලගින් වාඩිවෙලා පත්තර කියවනවා. මා ආ බව දැනුන විට සීයාගේ මුහුණ සතුටින් දිලෙනවා.

සමහර තැන් නොතේරෙන විට සීයාගේ මුහුණේ ඉරියව් වෙනස් වනබව දකින මම තවත් හයියෙන් හඩනගල කියවන විට සීයාගේ ඇස් සතුටින් දිලෙනවා. එවකට මම 8ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා.මගේ සීයා අවුරුදු 97 ජීවත් වුනා.

මම සීයාගෙන් මගේ ජීවිතයට ලබාගත් ආලෝකය තවත් එලිය කලේ මගේ ගුරුවරුන් අද දරුවන් තරගකාරී ලොවකට කොටුවෙලා දෙමව්පියන් එහි කොටස්ක-රුවන් බවට පත්වෙලා. රටක ජීවනාලිය වන්නේ අනාගතය භාරගැනීමට සිටින දරුවන් එකිනෙකා පරයා යන තරගයට දරුවන් කොටු නොකර නිදහස් මනසකින් ලොව දැකීමට ළමාකල සිටම හුරු කිරීම රටට ආදරය කරන වැඩිහිටි කාගේත් යුතුකමයි.